# මිල බලලයි ගන්න ඕන

හෙට තමයි පන්සලේ දානේ. දානේ වේල හොඳටම දෙන්න ඕන. ගෙදර දොරේ විය පැහැදම් කොහොම වුණත් හැම මාසෙකම එකම දිනයක දහවල් දානය සකසා පන්සලේ වැඩ සිටින හාමුදුරුවන් 10 නමකට පිළිගන්වන එක නම් මම කවදාවත්ම අමතක කළේ නැහැ. ලොකු පුතාගේ උපන් දිනය වෙනුවෙන් තමයි මේ වගේ දානේ වේලක් සකස් කරලා පූජා කරන්න හිතුවේ. මේක පුතා ඉපදුන දවසේ ඉඳලා හැම අවුරුද්දකම කරන දෙයක්. පුතාලා දැන් මගෙත් එක්ක නැතත් එදා පටන් කරපු දේ අමතක කරන්න නම් හිත දෙන්නෙම නැහැ. කුරුලු පැටවුන්ට පියාඹන්න පුලුවන් වුණාම උන් කැදැල්ලෙන් පියාඹා යනවා. ඒක තමයි ඇත්ත. දරුවො වුණත් එහෙමයි. ලොකු වුණාම එයාලගේ ලෝකේ හොයා ගෙන යනවා. ඒක වෙනස් කරන්න නම් බැහැ.

මොන දේ වුණත් දානේ ගැන ලොකු පුතාට මතක් කරන්න ඕන . හවස් වරුවේ කිසි වැඩකුත් නැති හින්දා කඩේට ගිහින් බඩු ටික ගන්න ඕන කියලත් හිතුනා. හන්දියේ තොග කඩේට ගියොත් ටිකක් අඩුවට බඩු ටික ගන්න පුලුවන් වෙයි. ගිය පාර බඩු ගන්න ගිය වෙලාවේ මුදලාලි කියනවා ඇහුනා හැම බඩුවකම මිල වැඩිවෙලා කියලා. හාල්වලත් ගාණ ගොඩාක් වැඩි කියලත් කිව්වා. මොනවා වුණත් දානේ ටික හොඳට දෙන්න ඕන. හාමුදුරුවන්ට ලෙඩත් වැඩි. ඒ හින්දා හොඳ හාල්වර්ගයක් තෝරා ගන්නත් ඕන.මෙහෙම හිත හිතා යනකොට දුරදීම දැක්කා කඩේ ලොකු වෙනසක්. හාල්, අල , ළූණු ඇතුලු කඩේ ඉස්සරහා තියෙන හැම භාණ්ඩයකම මිල ගණන් ලොකුවට ගහලා තියෙනවා. මුදලාලිගේ පොල් ගෙඩි සයිස් අකුරුවලින් ගහලා තියෙන නිසා දුර ඉඳලා වුනත් කියවා ගන්න පුළුවන්. මුලින්ම බැලුවේ හාල්වල ගණන්. සම්බා රු.98/- ,සුදු කැකුලු 105/-, රතු කැකුලු 105/-, නාඩු 98/- මෙහෙම තමයි මිලවල් දාල තිබුණේ. හාල්වල මිල ගණන් දැක්කට පස්සේ නම් හිතුනා රටකට ගිය කලක් කියලා. මම හිතා ගෙන හිටියේ ලොකු හාමුදුරුවන්ගේ අසනීප තත්වෙත් එක්ක රතු හාල් ටිකක් උයලා දෙන්නම් කියලා. ඒත් ඒ අදහස නම් වෙනස් කරන්න සිද්ධ වුණා. මේ දේවල් හිත හිතා කඩේට ගොඩ වෙන කොටම මුදලාලි හොඳ හිනාවක් එක්ක මාව පිළිගත්තේ අද ලොකු වෙළෙඳාමක් වෙන බව දැන ගෙනමයි.

"මුදලාලි මොකද මේ වෙනස් වෙලා. බෝඩ් කෑලිවල ගණන් ගහලා තියලා තියෙන්නේ. අපි කවදාවත් මුදලාලිව අවිශ්වාස කළේ නැහැනේ. මුදලාලි කියන ගාණට බඩු ගත්තා. කවදාවත් මුදලාලි හොරයක් බොරුවක් කරන්නේ නැහැ කියලා දන්නවානේ."

"ඔයාලා අපි විශ්වාසවන්ත මිනිස්සු වුණාට නීතියට ඒවා හරියන්නේ නැහැනේ. රටේ නීතියක් කියලා දේකුත් තියනවානේ."

"මොකක්ද මුදලාලි අපි නොදන්න ඒ නීතිය".

රටේ නීතියක් තියෙනවා. ඒ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයකුත් තියෙනවා. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කියන්නේ ඒක. ඉස්සරත් ඒ මහත්තුරු ආවා .ප්‍රයිස් කොන්ට්‍රෝල් එකෙන් පනිනවා කියන කොට කඩ මුදලාලිලා බයෙන් ඉන්නේ. ඒකම තමයි දැන් පාරිභෝගික කටයුතු පිළබඳ අධිකාරිය කියන්නේ."

"ඒ මහත්තුරු ඊයේ මේ පැත්තේ ආවා. හැබැයි මාව අල්ලන්න නෙවෙයි. මේ තියෙන නීති රීති ගැන මාව දැනුවත් කරන්න. එතකොට තමයි කිව්වේ මිල ගහලා එන්නේ නැති හැම භාණ්ඩයකම මිල ගණන් මට ගහන්න කියලා. එතකොට කඩේට එන අයට ඒ මිල ගණන් දැන ගෙන අතේ තියෙන සල්ලිවලට ගැළපෙන ගාණට බඩු ටික අරගෙන යන්න පුලුවන්. එතකොට බඩු අරගෙන ඉවර වෙලා සල්ලි මදි කියලා ගත්තු බඩු ටික කඩේ තියලා යන්න ඕන නැහැ".

"ඒක නම් ඇත්ත තමයි. නීතියක් තියේ නම් ඒ නීතියට අපිත් ගරු කරන්න ඕන"

"ඒ නීති දාලා තියෙන්නේ අපි කාගෙත් හොඳට.රටේ පුරවැසියෝ විදිහට අපි කවුරුත් ඒ නීතිවලට ගරු කරන්න ඕන."

මුදලාලිගේ කතාව ඉවර වෙනකොට කඩේ ඉන්න ළමයා මගේ බඩු ලිස්ට් එකේ බඩු ටික කිරලා බෑග් එකටත් දාලා ඉවරයි. සල්ලිත් ගෙවලා බඩු ටික අරගෙන පාරට බැස්සේ ඉක්මන් කරලා ගෙදරට එන්න හිතාගෙනයි.

සැකැස්ම

අවිශ්කා විරාජිනී
ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී
තරගකාරීත්ව ප්‍රවර්ධන අංශය
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය